කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2007

ප්‍රසාංගික කලා -PART. E1025

ශ්‍රී ලංකාවේ යාතුකර්ම

ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි කාලය : පැය 03 යි

---

01. යාතුකර්ම යන්න නිර්වචනය කොට, නාශක යාතුකර්ම හා ප්‍රීණන යාතුකර්ම පිළිබඳ නිදසුන් සහිත කෙටි විස්තරයක් කරන්න.

02. ශ්‍රී ලංකාවේ උඩරට, පහතරට සහ සබරගමු සම්ප්‍රදායන්ට අයත් ප්‍රධාන යාතුකර්ම පිළිබඳව හැඳින්වීමක් කරන්න.

03. කොහොඹා කංකාරියට පදනම් වූ පුරාවෘතය විමර්ශනය කොට, ඒ අනුව එම ශාන්තිකර්මයෙහි අභිප්‍රේතාර්ථය පැහැදිලි කරන්න.

04. සංක්‍රාන්තික රෝග නිවාරණය සඳහා ශ්‍රී ලංකාවේ බහුලව රඟ දක්වන ශාන්තිකර්මය කුමක්දැයි සඳහන් කොට එහි පූජා විධි රටාව පිළිබඳ කෙටි පැහැදිලි විස්තරයක් කරන්න.

05. ශ්‍රී ලංකාවේ පහතරට ප්‍රදේශවල ප්‍රචලිත යාතුකර්ම අතරින් ඔබ කැමති යාතුකර්මයක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කොට එහිදී භාවිත කරනු ලබන වස්ත්‍ර හා ආභරණ පිළිබඳ විස්තරයක් කරන්න.

06. සබරගමු සම්ප්‍රදායට අයත් මඩු ශාන්තිකර්ම පිළිබඳ විස්තරයක් කරන්න.

07. දේශීය ගැමි යාතුකර්මයන්හි ගායනයට, වාදනයට හා නර්තනයට හිමිව ඇති වැදගත්කම පිළිබඳව ඔබ කැමති ඕනෑම සම්ප්‍රදායකින් නිදසුන් සපයමින් සාකච්ඡා කරන්න.

08. දේශීය ගැමි යාතුකර්ම පිළිබඳව පවත්නා වර්තමාන සමාජ ආකල්ප පිළිබඳ විමර්ශනයක් කරන්න.

************************